# දීඝාවු උපාසක සූත්‍රය
11.08. 2018 ශ්‍රී ලංකාරාමය
නවසීලන්තය

> එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන දීඝාවු උපාසකො ආබාධිකො හොති දුක්ඛිතො බාළ්හගිලානො. අථ ඛො දීඝාවු උපාසකො පිතරං ජොතිකං ගහපතිං ආමන්තෙසි – ''එහි ත්වං, ගහපති, යෙන භගවා තෙනුපසඞ්කම; උපසඞ්කමිත්වා මම වචනෙන භගවතො පාදෙ සිරසා වන්ද – 'දීඝාවු, භන්තෙ, උපාසකො ආබාධිකො හොති දුක්ඛිතො බාළ්හගිලානො. සො භගවතො පාදෙ සිරසා වන්දතී'ති. එවඤ්ච වදෙහි – 'සාධු කිර, භන්තෙ, භගවා යෙන දීඝාවුස්ස උපාසකස්ස නිවෙසනං තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදායා'''ති. ''එවං, තාතා''ති ඛො ජොතිකො ගහපති දීඝාවුස්ස උපාසකස්ස පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි; උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ජොතිකො ගහපති භගවන්තං එතදවොච – ''දීඝාවු, භන්තෙ, උපාසකො ආබාධිකො හොති දුක්ඛිතො බාළ්හගිලානො. සො භගවතො පාදෙ සිරසා වන්දති. එවඤ්ච වදෙති – 'සාධු කිර, භන්තෙ, භගවා යෙන දීඝාවුස්ස උපාසකස්ස නිවෙසනං තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදායා'''ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන.

මේ තවත් සෝතාපත්ති සංයුත්තයේ තිබෙන සූත්‍රයක්. මේ සූත්‍රයේ සාවත්ථියං: කියලා නෑ. ඇයි එහෙම නැත්තේ? ඒකට හේතුව, මේක සිද්ධ වී තිබෙන්නේ වෙනත් තැනකයි. මේ සූත්‍රයේ නම **දීඝාවු උපාසක සූත්‍රය**. උපාසක තුමෙක් ගැනයි මේකෙන් කියවෙන්නේ.

**එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ** = එක් සමයක භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ රහගහනුවර වේළුවනාරාම කලන්දක නිවාපයෙහි වැඩ සිටිනවා.

**තෙන ඛො පන සමයෙන දීඝාවු උපාසකො ආබාධිකො හොති දුක්ඛිතො බාළ්හගිලානො** = ඒ කාලයේ දීඝාවු නම් උපාසක තුමා කුමක් හෝ වේවා රෝගාබාධයකින් පෙළිලා බොහෝම දුක්ඛිත තත්වයකට පත් උනා.

**අථ ඛො දීඝාවු උපාසකො පිතරං ජොතිකං ගහපතිං ආමන්තෙසි** = ඒ වෙලාවේ දීඝාවු කියන උපාසකතුමා තමන්ගේ තාත්තට කථා කරනවා. **'පිතරං ජොතිකං ගහපතිං'** කියලා කියන්නේ දීඝාවු උපාසක තුමාගේ තාත්තා, ජෝතික කියන ගෘහපති තුමා.

**''එහි ත්වං, ගහපති** = අනේ ගෘහපති තුමනි මෙහි එන්න

**යෙන භගවා තෙනුපසඞ්කම** = බුදුරජාණන්වහන්සේ වැඩ සිටින තැනට යන්න

**උපසඞ්කමිත්වා මම වචනෙන භගවතො පාදෙ සිරසා වන්ද** = බුදුරජාණන්වහන්සේ ළඟට ගිහිල්ලා මගේ වචනයෙන් බුදුරජාණන්වහන්සේට වන්දනා කරන්න. (මෙහෙම වන්දනා ක්‍රමයක් ඉස්සර තිබිලා තියෙනවා. ඒක සිරිතක්. දැන් අපි හිතමු අපේ ස්වාමීන්වහන්සේ දන්න ලොකු හාමුදුරුවෝ කෙනෙක් ඉන්නවා. මම යනවා ඒ ලොකු හමුදුරුවෝ හම්බවෙන්න. මම ගිහිල්ලා ඒ ලොකු හාමුදුරුවන්ට වඳිනවා තුන්පාරක්. ඒක ස්වභාවයක්. හැබැයි මේ වතාවේ මම අපේ ලොකු හාමුදුරුවෝ බලන්න යනකොට තව හාමුදුරුවෝ කෙනෙක් කියනවා 'එහෙනම් ඔබ වහන්සේ ලොකු හාමුදුරුවෝ ගාවට ගිහිල්ලා මගේ වැඳීමෙනුත් වඳින්න කියලා'. දැන් මට උන්වහන්සේගේ වන්දනාවකුත් කරන්න ඕනෑ. මගේ වන්දනාවත් කරන්න ඕනෑ. එහෙම අවස්ථාවකදී කරන්නේ මම වන්දනා කරනවා. වන්දනා කරලා නැවත වඳිනවා අපේ අර

අහවල් හාමුදුරුවන්ගේ වන්දනාවයි මේ කියලා. ඊට පස්සේ ඒ හාමුදුරුවෝ කියපු දේ කියනවා. ඒවගේ ක්‍රමයක් තිබෙනවා). මේ දීඝාවු උපාසකතුමාත් තාත්තට කියනවා ගිහිල්ලා මගේ වචනයෙන් බුදුරජාණන්වහන්සේගේ ශ්‍රී පාදයන් වන්දනා කරන්න කියලා.

**'දීඝාවු, භන්තෙ, උපාසකො ආබාධිකො හොති දුක්ඛිතො බාළ්හගිලානො. සො භගවතො පාදෙ සිරසා වන්දති'** = 'දීඝාවු කියන උපාසක තුමා අසනීප වෙලා ඉන්නේ. ඔහු භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී පාදයන් සිරසින් වඳී'

**එවඤ්ච වදෙහි** = නැවත මේ විදියටත් එතුමා තව පණිවිඩයක් කියනවා.

**'සාධු කිර, භන්තෙ, භගවා යෙන දීඝාවුස්ස උපාසකස්ස නිවෙසනං තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදායා'''** = 'ස්වාමීනී භාග්‍යවතුන්වහන්ස දීඝාවු උපාසක තුමා අසනීප වෙලා ඉන්නවා. ඔහුට අනුකම්පා කරලා ඔහුගේ නිවසට වඩින්න' කියන පණිවිඩය ඔහු කියනවා.

දැන් මෙහිදී අපිට හැඟෙන උපාසක තනතුරයි, මේ උපාසක තනතුරයි දෙකක් වගෙයි පෙන්නේ. මෙතැන සඳහන් වෙන විදියට තාත්තා උපාසකයෙක් නොවෙයි. තාත්තා ගෘහපතියෙක්. දැන් මෙතැනදී උපාසක කියන්නේ කවුද? තෙරුවන් සරණ ගිය පුතා. අද කාලේ උපාසකයා කියලා කියන්නේ කාටද? වයසක එක්කෙනා තමයි උපාසකයා. අපි එහෙම හිතුවට උපාසක කියන තනතුර එහෙම ගන්න බෑ. එහෙම ගන්න පුළුවන් එකක් නොවෙයි ඒක. එකට ගුණ තිබෙන්න ඕන. එහෙම නැතුව කොච්චර බිම බලාගෙන හිටියත් උපාසක වෙන්නේ නෑ. උපාසකයෙක් වෙන්න උපාසක ගුණ තිබෙන්න ඕන.

**''එවං, තාතා''ති බො ජොතිකො ගහපති දීඝාවුස්ස උපාසකස්ස පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි;** = 'හොඳයි දරුවා එහෙමයි' කියලා ජෝතික කියන ගෘහපති තුමා ඒ දීඝාවු කියන උපාසක දරුවාගේ වචනය පිළිඅරගෙන බුදුරජාණන්වහන්සේ හමුවෙන්න ගියා.

ඉතින් තාත්තා ගිහිල්ලා මේ දීඝාවු කියන තරුණ පුතාගේ අසනීප ගැනත් කියලා භාග්‍යවත් බුදුරජාණන්වහන්සේට අරාධනාවත් කරනවා.

**උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි** = ජෝතික කියන ගෘහපති තුමා ගිහිල්ලා බුදුරජාණන්වහන්සේට වන්දනා කරලා එකත්පසව ඉන්නවා.

**එකමන්තං නිසින්නො බො ජොතිකො ගහපති භගවන්තං එතදවොච** = පැත්තකින් ඉන්න මේ ජෝතික ගෘහපති තුමා බුදුරජාණන්වහන්සේට කථාව කියනවා.

**''දීඝාවු, භන්තෙ, උපාසකො ආබාධිකො හොති දුක්ඛිතො බාළ්හගිලානො** = අපේ දරුවා, දීඝාවු උපාසක තුමා අසනීප වෙලා. බොහොම පිරිහිලා, දැඩි සේ රෝගාතුර වෙලා.

**සො භගවතො පාදෙ සිරසා වන්දති** = ඔහු බුදුරජාණන් වහන්සේගේ සිරිපා වන්දනා කරනවා.

**එවඤ්ච වදෙති** = ඔහු මෙසේද කියනවා

**'සාධු කිර, භන්තෙ, භගවා යෙන දීඝාවුස්ස උපාසකස්ස නිවෙසනං තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදායා'''** = ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, දීඝාවු උපාසක තුමාට අනුකම්පා උපදවා ඔහුගේ නිවසට වඩිනවා නම් යහපති'.

දැන් මේ අවස්ථාව imagine කරන්න බලන්න. ගිහි කෙනෙක් ගිහිල්ලා බුදුරජාණන්වහන්සේට ආරාධනා කරනවා 'අසනීපයි බලන්න එන්න' කියලා. නිකං හිතලා බලන්න දැන් කාලෙ නම් වාහනයක් එව්වේ

නැත්නම් යන්නේ නෑ. මේ සිද්ධිය හොඳට හිතලා බලන්න. මේ එක්කෙනා වාහනයක් අරන් ගියාද? මොකක්වත් නෑ. දෙවියොත් වඳින බ්‍රහ්මයොත් වඳින ලෝකයේ ඉතාම ඉහළින් වැඩ සිටින ශ්‍රේෂ්ඨම උත්තමයෙකුට ගිහිල්ලා කියනවා අපේ දරුවා අසනීප වෙලා ඉන්නවා බලන්න එන්න කියලා. බුදුරජාණන්වහන්සේ මොකක් කරන්න ඇත්ද?

**අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන** = බුදුරජාණන්වහන්සේ ආරාධනාව නිශ්ශබ්ද භාවයෙන් පිළිගත්තා.

| |
|---|
| අථ ඛො භගවා නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන දීඝාවුස්ස උපාසකස්ස නිවෙසනං තෙනුපසඞ්කමි; උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා දීඝාවුං උපාසකං එතදවොච – ''කච්චි තෙ, දීඝාවු, ඛමනීයං, කච්චි යාපනීයං? කච්චි දුක්ඛා වෙදනා පටික්කමන්ති, නො අභික්කමන්ති; පටික්කමොසානං පඤ්ඤායති, නො අභික්කමො''ති? ''න මෙ, භන්තෙ, ඛමනීයං, න යාපනීයං. බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති, නො පටික්කමන්ති; අභික්කමොසානං පඤ්ඤායති, නො පටික්කමො''ති. ''තස්මාතිහ තෙ, දීඝාවු, එවං සික්ඛිතබ්බං – 'බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො භවිස්සාමි – ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති. ධම්මෙ…පෙ…. සඞ්ඝෙ…පෙ…. අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො භවිස්සාමි අඛණ්ඩෙහි…පෙ…. සමාධිසංවත්තනිකෙහි'. එවඤ්හි තෙ, දීඝාවු, සික්ඛිතබ්බ''න්ති. |

**අථ ඛො භගවා නිවාසෙත්වා** = භාග්‍යවතුන් වහන්සේ සිවුරු පොරවා ගත්තා

**පත්තචීවරමාදාය** = පාත්තරයයි සිවුරයි අරගෙන (පත්තචීවරමාදාය කියන තැන නැවත වතාවක් චීවරය ගැන කියවෙනවා. ඒ කියන්නේ, සිවුරු පොරවන එකකකුත් තිබෙනවා කරේ දාන එකකුත් තිබෙනවා. උෂ්ණ කාලෙට සිවුරු දෙකම පොරවන්නේ නෑ. අඳනය ඇඳගෙන තනිපට සිවුර පොරවාගෙන සඟල සිවුරත් පාත්තරයත් අරගෙන කියන එකයි එතැන කියවෙන්නේ)

**යෙන දීඝාවුස්ස උපාසකස්ස නිවෙසනං තෙනුපසඞ්කමි** = දීඝාවු උපාසක තුමාගේ නිවසට වැඩම කළා.

**උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි** = ඒ නිවසට වැඩම කරලා පනවපු ආසනයේ වැඩ හිටියා.

බලන්න, වජ්‍රාසනය හොල්ලාගෙන කම්පා කරගෙන ලොව්තුරා බුදුවෙච්ච බුදුරජාණන්වහන්සේ අර ගෙදරට වැඩම කළා. වැඩම කරලා ඒ ගෙදරක පනවන ලද ආසනයක වැඩ හිටියා. බුදුරජාණන්වහන්සේ මොනතරම් කරුණාවන්තයිද මොන තරම් නිහතමානියිද, අර පනවපු ආසනේ වැඩ හිටියා.

**නිසජ්ජ ඛො භගවා දීඝාවුං උපාසකං එතදවොච** = වාඩි වී සිටින බුදුරජාණන්වහන්සේ දීඝාවු උපාසක තුමාට මේ විදියට කථාවක් කියනවා.

**''කච්චි තෙ, දීඝාවු, ඛමනීයං,** = කොහොමද දීඝාවු ශරීර අපහසුකම් අමාරුකම්

**කච්චි යාපනීයං?** = ඉවසන්න පුළුවන්ද?

**කච්චි දුක්ඛා වෙදනා පටික්කමන්ති, නො අභික්කමන්ති** = ශාරීරික වේදනා අඩුවෙන ගතියක් තිබෙනවද? වැඩිවෙන ගතියක්ද නැත්ද?

**පටික්කමොසානං පඤ්ඤායති, නො අභික්කමො''ති?** = අඩුවෙන පැත්තට බරයිද? වැඩි වෙන බවක් පේන්න නැත්ද?

**''න මෙ, භන්තෙ, ඛමනීයං, න යාපනීයං** = ස්වාමීනි ඉවසන්න අමාරුයි. යැපෙන්න හරි අමාරුයි.

**බාළ්හා මෙ දුක්ඛා වෙදනා** = මාගේ ශාරීරික වේදනා හරිම වැඩියි.

**අභික්කමන්ති** = වේදනාව වැඩි වෙනවා.

**නො පටික්කමන්ති** = අඩු වීමක් නෑ

**අභික්කමොසානං පඤ්ඤායති, නො පටික්කමො''** = වැඩි වෙන හැටි තමයි පේන්නේ, අඩු වීමක් පෙන්නේ නෑ.

දැන් මේ කථාව කියන්නේ දීඝාවු උපාසක තුමා. දැන් දීඝාවු උපාසක තුමා බුදුරජාණන්වහන්සේට ලෙඩේ තත්වය කිව්වා. මේක සුළුපටු ලෙඩක් නොවෙයි. බරපතල විදියට තිබෙන ලෙඩක්. දැන් මේ කථාව ඇත්තද? කොහොමද ඇත්තක් කියලා අපි දැනගන්නේ? සූත්‍රයෙන් තමයි දැන ගන්න ඕන ඇත්තද කියලා. උපාසක කෙනක් බොරු කියන්නේ නෑ. කවදාකවත් බොරු කාරයන්ගේ ගෙවල්වලට බුදුරජාණන්වහන්සේ වඩින්නේ නෑ. තථාගතයන් වහන්සේ වැඩම කරන්නේ ධර්මය ගරු කරන සීලය ගුණය තිබෙන්නා වූ තැන් වලට. ඉතින් මේ දීඝාවු උපාසක තුමා ඇත්තම කිව්වා.

ඊළඟට බුදුරජාණන්වහන්සේ දීඝාවු උපාසක තුමාට කියනවා මෙහෙම කථාවක්.

**''තස්මාතිහ තෙ, දීඝාවු, එවං සික්ඛිතබ්බං** = එහෙම නම් දීඝාවු නුඹ මේ විදියට පුරුදු කරන්න

(දැන් සමහර වෙලාවට අපි ගියහම ඔය ලෙඩ වලට පිරිත් කියන්න ඒ ලෙඩා ඔක්කෝම අපිට පවරනවා. පිරිත් හයියෙන් කියලා හරි වැඩියෙන් කියලා හරි එයාගේ වේදනාවද pressure එකද ඔක්කොම අපි බස්සලා දෙන්න ඕන. ඔහොම දේවල් අපිට සිද්ධ වෙලා තිබෙනවා. එහෙම කරේ නැත්නම් අපේ සිලුත් නෑ අපි හාමුදුරුවරුත් නෙමෙයි). දැන් බලන්න මේ කථාව. දීඝාවු කිව්වේ නෑ 'ස්වාමීනී මට පිරිත් කියලා මේ ටික අඩු කරලා දෙන්න' කියලා. සූත්‍ර ඉගෙන ගන්න කියලා කියන්නේ ඕකයි. බලන්න මේකේ ලස්සන වාක්‍යයක් තිබෙනවා **''තස්මාතිහ තෙ, දීඝාවු, එවං සික්ඛිතබ්බං** කියලා. මෙහිදී බුදුරජාණන්වහන්සේ දීඝාවු උපාසක තුමාට වැඩක් පවරනවා. නමුත් දීඝාවු උපාසක තුමා බුදුරජාණන්වහන්සේට වැඩ පවරන්නේ නෑ.

**'බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො භවිස්සාමි** = මම බුදුරජාණන්වහන්සේ කෙරෙහි අචල සද්ධාවෙන් සමන්නාගත වුවෙක් වෙන්නෙමි යි හික්මෙන්න. (**භවිස්සාමි** කියන්නේ අනාගත වචනයක් ඒකෙ තේරුම් = වෙන්නෙමි)

**ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා** = ''ඒ භාග්‍යවතුන් වහන්සේ මෙසේත් අරිහත් වෙන සේක. සම්‍යක්සම්බුද්ධවන සේක. විජ්ජාචරණ සම්පන්න වෙන සේක. සුගත වෙන සේක. ලෝකවිදූ වෙන සේක. අනුත්තර පුරිසදම්මසාරථී වෙන සේක දෙවි මිනිසුන්ට ශාස්තෘ වෙන සේක. චතුරාර්ය සත්‍ය අවබෝධ කළ සේක. භාග්‍යවත් සේක යනුවෙන්.

**'ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො භවිස්සාමි** = ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ වෙන්නෙමියි හික්මෙන්න.

**'ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනෙය්‍යිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී** යන ගුණයන්ගෙන් යුක්තයි යනුවෙන් හික්මෙන්න.

**සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො භවිස්සාමි** = සංඝයා කෙරෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයෙක් වෙන්නෙමියි හික්මෙන්න.

**සඝ ගුණ - සුප්පටිපන්නො භගවතො සාවකසඞ්ඝො, උජුප්පටිපන්නො භගවතො සාවකසඞ්ඝො, ඤායපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, සාමීචිප්පටිපන්නො භගවතො සාවකසඞ්ඝො, යදිදං – චත්තාරි පුරිසයුගානි අට්ඨ පුරිසපුග්ගලා, එස භගවතො සාවකසඞ්ඝො ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස** යනුවෙන්.

ඊළඟට බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා...

**අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො භවිස්සාමි** = අරිය කාන්ත සීලයෙන් සමන්නාගත වෙමියි හික්මෙන්න.

**අඛණ්ඩෙහි අච්ඡිද්දෙහි අසබලෙහි අකම්මාසෙහි භුජිස්සෙහි විඤ්ඤුප්පසත්ථෙහි අපරාමට්ඨෙහි සමාධිසංවත්තනිකෙහි** = කෙළවරකින් කැඩුණු නැති, මැදින් කැඩුණු නැති, සිල් දෙක තුනක් එකට කැඩිලත් නැති, ශක්තිය නැති කරගෙනත් නැති තමන් අවංකවම ඕනෑකමින් සීලය සමාදන් වෙලා කඩන්නේ නැතුව ඥානවන්තයන් විසින් ප්‍රශංසා කරන්නා වූ ආකාරයට සීලය ජීවිතියේ කොටසක් කරගෙන ඒ සීලය නිසා මට දිව්‍යය සම්පත්තිය ලැබේවා, මම බලවත් කෙනෙක් වේවා කියලා දෘෂ්ඨිගත වෙන්නේ නැතුව හික්මෙන්න යනුවෙන්.

**එවඤ්හි තෙ, දීඝාවු, සික්ඛිතබ්බ''න්ති**. = දීඝාවු ඔබ මේ කරුණු 4 පුරුදු කරන්න.

දැන් බලන්න බුදුරජාණන්වහන්සේ ලස්සනට වැඩේ පැවරුවා. බුදුරජාණන්වහන්සේ කාරණා 4 දේශනා කළා. බුද්ධ රත්නය කෙරෙයි ධම්ම රත්නය කෙරෙහි සහ සංඝ රත්නය කෙරෙහි ශ්‍රද්ධාව තිබිය යුතුයි. අරියකාන්ත සීලයෙන් සමන්නාගත විය යුතුයි කියලා මෙහෙම දේශනා කළ පසු දීඝාවු මෙහෙම කථාවක් කියනවා.

''යානිමානි, භන්තෙ, භගවතා චත්තාරි සොතාපත්තියඞ්ගානි දෙසිතානි, සංවිජ්ජන්තෙ තෙ ධම්මා මයි, අහඤ්ච තෙසු ධම්මෙසු සන්දිස්සාමි. අහඤ්හි, භන්තෙ, බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො

– ඉතිපි සො භගවා...පෙ.... සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති. ධම්මෙ...පෙ.... සඞ්ඝෙ...පෙ.... අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො අඛණ්ඩෙහි...පෙ.... සමාධිසංවත්තනිකෙහී''ති. ''තස්මාතිහ ත්වං, දීඝාවු, ඉමෙසු චතූසු සොතාපත්තියඞ්ගෙසු පතිට්ඨාය ඡ විජ්ජාභාගියෙ ධම්මෙ උත්තරි භාවෙය්‍යාසි. ඉධ ත්වං, දීඝාවු, සබ්බසඞ්ඛාරෙසු අනිච්චානුපස්සී විහරාහි, අනිච්චෙ දුක්ඛසඤ්ඤී, දුක්ඛෙ අනත්තසඤ්ඤී පහානසඤ්ඤී විරාගසඤ්ඤී නිරොධසඤ්ඤීති. එවඤ්හි තෙ, දීඝාවු, සික්ඛිතබ්බ''න්ති.

**''යානිමානි, භන්තෙ, භගවතා චත්තාරි සොතාපත්තියඞ්ගානි දෙසිතානි** = භාග්‍යවත් බුදුරජාණන්වහන්ස, බුදුරජාණන්වහන්සේ විසින් යම් කිසි සෝතාපන්න අංග සතරක් දේශනා කලා නම්

**සංවිජ්ජන්තෙ තෙ ධම්මා මයි** = භාග්‍යවතුන් වහන්ස ඒ ධර්ම හතර මගේ ගාව තිබෙනවා. **'මයි'** = මා කෙරෙහි. **තෙ ධම්මා** = ඒ ධර්මයෝ. **සංවිජ්ජන්තෙ** = මා තුල ඒ ධර්මයෝ තිබෙනවා = These Dhammas are found in me.

**අහඤ්ච තෙසු ධම්මෙසු සන්දිස්සාමි =** මම ඒ ධර්ම පිළිබඳව මෙනෙහි කරනවා

**අහඤ්හි, භන්තෙ, බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො - ධම්මේ අවෙච්චප්පසාදෙන සමන්නාගතො - සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො - අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො** = මේ ධර්ම හතර මා

තුල තිබෙන බව මම දකිනවා, මට දැනෙනවා කියලා දීඝාවු උපාසක තුමා බුදුරජාණන්වහන්සේට ප්‍රකාශ කරනවා.

ඊළඟට බුදුරජාණන්වහන්සේ නැවත මෙසේ දේශනා කරනවා

**''තස්මාතිහ ත්වං, දීඝාවු, ඉමෙසු චතූසු සොතාපත්තියඞ්ගෙසු පතිට්ඨාය** = එහෙනම් දීඝාවු ඔබ සෝතාපන්න අංග හතරේ පිහිටලා

**ඡ විජ්ජාභාගියෙ ධම්මෙ උත්තරි භාවෙය්‍යාසි** = විද්‍යාභාගී ධර්මයන් 06 වැඩි වැඩියෙන් වඩන්න

දැන් මෙහිදී බුදුරජාණන්වහන්සේ දේශනා කළේ නෑ සෝතාපන්න අංග වඩන්න කියලා. දීඝාවු උපාසක තුමා තමයි කිව්වේ තමන් තුල ඒ ධර්ම 4 තිබෙන බව. සෝවාන් උනාට පස්සේ ලැබෙන අංග වලටත් කියනවා සෝතාපන්න අංග කියලා. ඒ හතර තමයි මේ දැන් ප්‍රකාශ කළ අංග හතර. මේ සූත්‍රයේ සඳහන් සෝතාපන්න අංග 4 අමතරව තවත් තිබෙනවා සෝතාපන්න අංග හතරක්. ඒ තමයි සෝවාන් ඵලයට පත්වෙන්න පිරිය යුතු අංග = සත් පුරුෂ සංසේවනය, සත්ධර්ම ශ්‍රවණය, යෝනිසෝ මනසිකාරය සහ ධම්මානු ධම්ම ප්‍රතිපත්තිය කියන්නා වූ හතර.

දැන් ඥාන කථා කියලත් දෙකක් තිබෙනවා. එකක් ධර්ම රසයි. අනිත් එක පැණි රසයි. එකක් අහලා කනින් ගන්න ඕන. අනිත් එක කටින් හපලා කන්න ඕන. හැබැයි දෙකම ඥාන කථාම තමයි. ඒක නිසා අපි දැනගන්න ඕනෑ මොන කථාද කියලා. ඒවගේ සෝතාපත්ති අංග කිව්වහම මාර්ගයේ යන ධර්මද නැත්නම් සෝවාන් ඵලයට පත් උනාට පස්සේ ඇති වූ ධර්මද කියලා අපි දැනගන්න ඕන. දැන් මෙතැනදී දීඝාවුට බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා **ඉමෙසු චතූසු සොතාපත්තියඞ්ගෙසු පතිට්ඨාය** කියලා. ඒ කියන්නේ සෝතාපන්න අංග 4 පිහිටලා විද්‍යාභාගී ධර්මයන් 06 වඩන්න කියලා කියනවා = **ඡ විජ්ජාභාගියෙ ධම්මෙ උත්තරි භාවෙය්‍යාසි.**

ඒ හය තමයි ..

**ඉධ ත්වං, දීඝාවු** = ඔබ

1) **සබ්බසඞ්ඛාරෙසු අනිච්චානුපස්සී විහරාහි** = සියලුම සංස්කාර ධර්මයන් කෙරෙහි අනිත්‍ය දකිමින් වාසය කරන්න. එනම් ආධ්‍යාත්මීය බාහිර - ඕලාරික සුඛුම - හීන ප්‍රණීත - ළඟ දුර - අතීත අනාගත ආදී සියලුම සංස්කාරයන් කෙරෙහි අනිත්‍යය දැකගෙන දැනගෙන වාසය කරන්න.
2) **අනිච්චෙ දුක්ඛසඤ්ඤී** = යමක් අනිත්‍යයි නම් ඒක දුකයි කියලා දැන ගනිමින් වාසය කරන්න.
3) **දුක්ඛෙ අනත්තසඤ්ඤී** = යමක් දුකයි නම් ඒක අනාත්ම වශයෙන් දකිමින් වාසය කරන්න.
4) **පහානසඤ්ඤී** = අයින් කිරීමේ සංඥාව ඇතුව වාසය කරන්න
5) **විරාගසඤ්ඤී** = නොඇලීමේ සංඥාව ඇතුව වාසය කරන්න.
6) **නිරොධසඤ්ඤීති** = නිවී යෑමේ සංඥාව ඇතුව වාසය කරන්න.

**එවඤ්හි තෙ, දීඝාවු, සික්ඛිතබ්බ''න්ති** = දීඝාවු ඔබ මේ **ධර්ම 6** පුරුදු කළ යුතුයි කියලා බුදුරජාණන්වහන්සේ පවරනවා.

ඊළඟට දීඝාවු මෙහෙම කථාවක් කියනවා.

''යෙමෙ, භන්තෙ, භගවතා ඡ විජ්ජාභාගියා ධම්මා දෙසිතා, සංවිජ්ජන්තෙ තෙ ධම්මා මයි, අහඤ්ච තෙසු ධම්මෙසු සන්දිස්සාමි. අහඤ්හි, භන්තෙ, සබ්බසඞ්ඛාරෙසු අනිච්චානුපස්සී විහරාමි, අනිච්චෙ දුක්ඛසඤ්ඤී, දුක්ඛෙ අනත්තසඤ්ඤී පහානසඤ්ඤී විරාගසඤ්ඤී නිරොධසඤ්ඤී. අපි ච මෙ, භන්තෙ,

එවං හොති – 'මා හෙවායං ජොතිකො ගහපති මමච්චයෙන විඝාතං ආපජ්ජති "මා ත්වං, තාත දීඝාවු, එවං මනසාකාසි. ඉඞ්ඝ ත්වං, තාත දීඝාවු, යදෙව තෙ භගවා ආහ, තදෙව ත්වං සාධුකං මනසි කරොහී''ති.

**''යෙමෙ, භන්තෙ, භගවතා ඡ විජ්ජාභාගියා ධම්මා දෙසිතා** = ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේ මට විජ්ජා භාගිය ධර්ම හයක් දේශනා කළා නම්

**සංවිජ්ජන්තෙ තෙ ධම්මා මයි** = ඒ ධර්ම ටික මගේ ගාව තිබෙනවා.

දැන් මේ උපාසක තුමා ගාව සෝතාපන්න අංග 4 යි විජ්ජා භාග ධර්ම 6 ත් එක්ක ඔක්කොම ධර්ම 10 ක් තිබෙනවා. දැන් අපිට හිතාගන්න පුළුවන් කවුද මේ කියලා. දීඝාවු කියලා කියන්නේ අනාගාමී වූ කෙනෙක්.

**අහඤ්ච තෙසු ධම්මෙසු සන්දිස්සාමි** = මමත් ඒ ටික මා තුල තිබෙනවා කියලා දකිනවා.

**අහඤ්හි, භන්තෙ, සබ්බසඞ්ඛාරෙසු අනිච්චානුපස්සී විහරාමි** = ස්වාමීනී මම සියලුම සංස්කාරයන් කෙරෙහි අනිත්‍යය දකිමින් වාසය කරනවා.

**අනිච්චෙ දුක්ඛසඤ්ඤී විහරාමි** = යමක් අනිත්‍යයි නම් එය දුක බව දැනගෙන වාසය කරනවා.

**දුක්ඛෙ අනත්තසඤ්ඤී විහරාමි** = දුකෙහි අනාත්ම සඥාව ඇතුව වාසය කරනවා.

**පහානසඤ්ඤී විහරාමි** = මම ප්‍රහාණ සංඥාවෙන් යුතුව වාසය කරනවා.

**විරාගසඤ්ඤී විහරාමි** = මම විරාග සංඥාවෙන් යුක්තව වාසය කරනවා.

**නිරොධසඤ්ඤී විහරාමි** = මම නිරෝධ සංඥාවෙන් යුක්තව වාසය කරනවා.

**අපි ච මෙ, භන්තෙ, එවං හොති** = ඒ උනත් ස්වාමීනී මට මෙහෙම අදහසක් එනවා

**'මා හෙවායං ජොතිකො ගහපති මමච්චයෙන විඝාතං ආපජ්ජී'''ති** = 'මගෙන් පස්සේ මගේ තත්තා ජෝතික ගෘහපති තුමා පීඩාවකට දුකකට පත් නොවේවා කියලා හැඟීමක් ඇතිවෙනවා' කියලා දිඝාවු කියනවා.

එවිට ජෝතික ගෘහපති මෙහෙම කියනවා

**''මා ත්වං, තාත දීඝාවු, එවං මනසාකාසි** = දීඝාවු ඔබ එහෙම හිතන්න එපා.

**ඉඞ්ඝ ත්වං, තාත දීඝාවු, යදෙව තෙ භගවා ආහ, තදෙව ත්වං සාධුකං මනසි කරොහී''** = එහෙම හිතන්නේ නැතුව දීඝාවු භාග්‍යතුන්වහන්සේ යමක් දේශනා කළාද ඒ විදියට මෙනෙහි කරන්න.

අථ ඛො භගවා දීඝාවුං උපාසකං ඉමිනා ඔවාදෙන ඔවදිත්වා උට්ඨායාසනා පක්කාමි. අථ ඛො දීඝාවු උපාසකො අචිරපක්කන්තස්ස භගවතො කාලමකාසි. අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු; උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං – ''යො සො, භන්තෙ, දීඝාවු නාම උපාසකො භගවතා සංඛිත්තෙන ඔවාදෙන ඔවදිතො සො කාලඞ්කතො. තස්ස කා ගති, කො අභිසම්පරායො''ති? ''පණ්ඩිතො, භික්ඛවෙ, දීඝාවු උපාසකො, පච්චපාදි ධම්මස්සානුධම්මං, න ච මං ධම්මාධිකරණං

| |
|---|
| විහෙසෙසි දීඝාවු, භික්ඛවෙ, උපාසකො පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා''ති. |

**අථ ඛො භගවා දීඝාවුං උපාසකං ඉමිනා ඔවාදෙන ඔවදිත්වා** = බුදුරජාණන්වහන්සේ මේ විදියට දීඝාවු උපාසක තුමාට අවවාද කරලා

**උට්ඨායාසනා පක්කාමි** = ආසනයෙන් නැගිටලා විහාරයට වැඩම කළා.

**අථ ඛො දීඝාවු උපාසකො** = ඊට පස්සේ ඒ දීඝාවු උපාසක තුමා

**අචිරපක්කන්තස්ස භගවතො** = බුදුරජාණන්වහන්සේ වැඩම කරලා ටික වේලාවකින්ම

**කාලමකාසි** = අන්තරා උනා

**අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු; උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු** = මේ කථාව අහලා බොහෝ භික්ෂූන් වහන්සේලා පැමිණිලා බුදුරජාණන්වහන්සේට වැඳලා වාඩිවෙලා ඉන්නවා.

**එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං** = පැත්තකට වෙලා වාඩිවෙලා ඉන්න ඒ භික්ෂූන් වහන්සේලා බුදුරජාණන් වහන්සේට මේ විදියට කියනවා,

**''යො සො, භන්තෙ, දීඝාවු නාම උපාසකො** = ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස අර දීඝාවු කියන උපාසක තුමා

**භගවතා සංඛිත්තෙන ඔවාදෙන ඔවදිතො සො කාලඞ්කතො** = බුදුරජාණන්වහන්සේ කෙටි අවවාදයකින් අවවාද කරපු ඒ උපාසක තුමා කාලක්‍රියා කළා

**තස්ස කා ගති, කො අභිසම්පරායො''ති?** = **තස්ස කා ගති** = එතුමාගේ ඊළඟ ගතිය මොකක්ද? **කො අභිසම්පරායො** = නැවත ඉපදුනේ කවුරු හැටියටද කියලා භික්ෂූන් වහන්සේලා අහනවා.

ඊට පස්සේ බුදුරජාණන්වහන්සේ මෙසේ දේශනා කරනවා

**''පණ්ඩිතො, භික්ඛවෙ, දීඝාවු උපාසකො** = මහණෙනි, ඒ දීඝාවු උපාසක තුමා හරි පණ්ඩිතයි ඥානවන්තයි.

(මේ දීඝාවු උපාසක තුමා හරිම ඥාවන්තයි හැබයි කිසිම ප්‍රසිද්ධියක් උසුලන්නේ නෑ. ඒක ඥානවන්ත අයගේ ස්වභාවයක්).

**පච්චපාදි ධම්මස්සානුධම්මං - 'පච්චපාදි'** කියලා කියන්නේ කවදාකවත්ම වෙනත් ශාස්තෘ කෙනෙක් ගාවට යන්නේ නෑ. **ධම්මස්සානුධම්මං** = ධම්මානුධම්ම ප්‍රතිපදාවේ හිටියා.

**න ච මං ධම්මාධිකරණංවිහෙසෙසි** = ධර්මය තේරුම් ගන්න ඕන කියලා ප්‍රශ්න අසමින් මාව වෙහෙස කළේ නෑ.

(ස්වාමීනී ඔය කියපු දේ මට තේරෙන්නේ නෑ, තව ටිකක් විස්තර කරලා දෙන්න කියලා සමහර අවස්ථාවලදී දෙවි දේවතාවෝ සහ භික්ෂූන් වහන්සේලා කියනවා. බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා දීඝාවු උපාසක තුමා එහෙම නොවෙයි, එයා බොහෝම ඥානවත්න එක්කෙනෙක්. ධර්මය කියලා දෙන්න ගියහම මට කරදරයක් උනේ නෑ කියලා).

**දීඝාවු, භික්ඛවෙ, උපාසකො පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා** = දීඝාවු උපාසක තුමා ඕරම්භාගීය සංයෝජන 5 හම ක්‍ෂය කරලා

**ඔපපාතිකො හොති** = ඕපපාතිකව ඉපදුනා.

**තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා''ති** = එහෙදීම පිරිනිවන් පානවා. **'තස්මා ලෝකා'** කියලා කියන්නේ ඒ ලෝකයෙන් මෙහා ලෝකයට - **අනාවත්තිධම්මො** = උප්පත්ති වශයෙන් එන්නේ නෑ.

'බ්‍රහ්ම ස්වරූපයෙන්ම වෙනත් ලෝකයකට ඇවිල්ලා යන්න පුළුවන් නමුත් උප්පත්ති වශයෙන් එන්නේ නෑ' කියලා බුදුරජාණන්වහන්සේ මේ කාරණය දේශනා කරනවා.

කොහෙද මේ උපාසක තුමා ඕපපාතිකව ඉපදුනේ? සුද්ධාවාස බ්‍රහමලෝකේ. මේ උපාසකතුමා අනාගාමී කෙනෙක්. පංචඕරම්භාගීය සංයෝජන නැතිවෙන්නේ අනාගාමී උත්තමයන් තුල. සූත්‍ර දේශනාවේ කියන්නේ නෑ මේ උපාසක තුමා අනාගාමී කියලා. ධර්ම වලින් තමයි දැනගන්නේ, ප්‍රකාශනයෙන් තමයි දැනගන්නේ එයා අනාගාමී ද සෝවාන් ද කියලා. සූත්‍රයක් දිහා බැලුවහම අපි දැනගන්න ඕන මේ කියන ධර්ම වලට අනුකූලව මෙයා කවුද මෙයාට මොකද වෙන්නේ කියලා.

දැන් බලන්න මේ සිදුවීම්. බුදුරජාණන්වහන්සේ කෙනෙකුට සෝවාන් වෙන්න අවශ්‍ය කරන ධර්ම ටිකයි ඊට පස්සේ වැඩිය යුතු ධර්ම 6 කුත් කියලා දෙනවා. මොනවාද ඒ වැඩිය යුතු ධර්ම 6? සියලුම සංස්කාර ධර්මයන්ගේ අනිත්‍යයත්වය, අනිත්‍යය වූ ඒ ධර්මයන්ගේ දුක්ඛ ස්වභාවය, ඒ ධර්ම දුක නම් එහි ඇති අනාත්ම ස්වභාවය, ප්‍රහාණය කිරීමේ හැඟීම, විරාග හැඟීම සහ නිරෝධ සංඥාව. මේ ටික වඩන්න ඕන. මේ ධර්ම ගිරිමානන්ද සූත්‍රයෙත් තිබෙනවා. මේ ටික අපේ හිතේ තිබෙන්න ඕන. මේ ටික අපේ හිතේ වැඩෙන්න ඕන. මෙනෙහි කරන්න ඕන. එහෙම මෙනෙහි කරනකොට තමයි මේ ධර්ම ටික ඇතිවෙන්නේ.

මේ සූත්‍ර දේශනාවේ තිබෙන ධර්ම ටික අපි හොඳට තේරුම් අරගෙන අපි හැම කෙනාම චතුරාර්ය සත්‍ය ධර්මයන් අවබෝධ කරගෙන නිවනින් සැනසෙන්න මේ ධර්මය අපිට පිහිට වේවා! කියලා අධිෂ්ඨාන කරගත යුතුයි.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස අනාගාමී කෙනෙකුට තමන්ගේ තාත්තා ගැන ඇල්මක් ඇතිවෙයිද? මේ සූත්‍රයේ කියපු විදියට තාත්තා ගැන දුකයි කියලා.

<u>පිළිතුර</u> - නෑ, ඇල්මක් ඇති වෙන්නේ නෑ.

මේ සූත්‍රය දිහා බැලුවට පස්සේ තිබෙනවා සමාජ කරුණු කීපයක් දැනගන්න. ඒ තමයි, පුතා යවනවා තාත්තාව බුදුරජාණන්වහන්සේව වන්දනා කරන්න කියලා. එතකොට තේරෙන්නේ නැත්ද ඒ පවුලේ හොඳ සමගියක් තිබෙනවා කියලා. රණ්ඩුවක් නෑ. එතකොට තාත්තා යන්නේ පුතා වෙනුවෙන් පණිවිඩයක් අරගෙන. පණිවිඩේ මොකක්ද? 'මම අසනීපයි, එන්න බෑ මට අමාරුයි, ඒක නිසා බුදුරජාණන්වහන්සේට වඩින්න කියලයි' ආරාධනා කරන්නේ. ඊට පස්සේ තාත්තට කියනවා මගේ නමින් බුදුරජාණන්වහන්සේට වඳින්න කියලා. ඇයි පුතා තාත්තට කියන්නේ යන්න කියලා? ඒ කියන්නේ තාත්තා විස්වාසයි. තාත්තා කොහොම හරි මේ වැඩේ කරලා දෙනවා කියලා පුතා දන්නවා. තාත්තා යන්නේ ඒ පණිවිඩය අරගෙන පුතා වෙනුවෙන්. දරුවා කියන කැක්කුමත් තාත්තට තිබෙනවා. අනිත් එක තමයි බුදුරජාණන්වහන්සේට ආරාධනා කරනවා, බුදුරජාණන්වහන්සේ ඒ ගෙදරට වඩිනවා. බුදුරජාණන්වහන්සේත් වඩින්නේ ඒ ගෙදරට බුදුරජාණන්වහන්සේටත් තිබෙනවා ඒ පවුල ගැන විස්වාසයක්. තවත් එකක් තමයි බුදුරජාණන්වහන්සේ වඩින කොට ඒ දරුවා විතරද හිටියේ? නෑ තාත්තත් හිටියා. අනිත් අයත් ඉන්න ඇති. නමුත් කථාවට සම්බන්ධ වෙන්නේ දීඝාවු උපාසක තුමයි තාත්තයි විතරයි.

දීඝාවු උපාසක තුමා කියනවා **'අපි ච මෙ, භන්තෙ, එවං හොති'** කියලා. ඒකෙන් කියන්නේ 'එහෙම උනත් ස්වාමිනී, මේ විදියේ අදහසක් මට එනවා' කියලා. ඒකෙන් කියන්නේ නෑ 'මට දුකයි, මට ඇඬෙනවා' කියලා. එහෙම කියන්නේ නෑ. ඒක හරියට 'even though Venerable Sir, it occurred to me this way'

කියලා කියනවා වගේ 'I have some thougts about my father' කියනවා වගේ තේරුමක් මෙතන තිබෙන්නේ.

<u>මහත්මියක්</u> - ස්වාමීන්වහන්ස ඒ දීසාවු උපාසක තුමා දන්නවනේ තාත්තා තමන් තරම් ධර්මය අවබෝධ කරගෙන නෑ කියලා. ඒකයි.

<u>ස්වාමීන්වහන්සේ</u> - ඔව් එහෙම එකකුත් තිබෙනවා. ඒක විශේෂයි. ඒ කියන්නේ, තාත්තා ධර්මයෙන් ටිකක් අඩුයි. ඒක නිසා තාත්තා කොහොමද ධර්මයෙන් නඟා සිටුවන්නේ කියන එක තමයි ඒ උපාසක තුමාගේ හිතේ තිබෙන්නේ. නැතුව දාල යන්න බැරි කමක්වත් එහෙම එකක් නොවෙයි. අනිත් එක තමයි දැන් මේ උපාසක තුමා යන්නයි යන්නේ. එතකොට තාත්තට ධර්මයෙන් පිහිටක් තමයි හදලා දෙන්න හිතන්නේ. මෙතැන **මමච්චයෙන විඝාතං ආපජ්ජති** කියලා කියන්නේ 'මගේ ඇවෑමෙන් පස්සේ අපේ තාත්තා මම කෙරෙහි දුක් ඇති නොවී ඉන්නවා නම් හොඳයි' කියන එකයි.


එතකොට තාත්තා කියනවා **"මා ත්වං, තාත දීඝාවු, එවං මනසාකාසි. ඉඬස ත්වං, තාත දීඝාවු, යදෙව තෙ භගවා ආහ, තදෙව ත්වං සාධුකං මනසි කරොහී"** = මේ දරුවා, ඔයා ඔය විදියට හිතන්න යන්න එපා. බුදුරජාණන් වහන්සේ කියපු විදියට හික්මෙන්න' කියලා. බලන්න ඒ පවුල් සංස්ථාව. ධර්මයත් එක්ක යනකොට තිබෙන සම්බන්ධය. දැන් අපි උනත් කවුරුහරි ලෙඩ ඇඳේ ඉන්නකොට කියන්නේ 'අපි අපේ වැඩ බලාගන්නම්, ඔය බෙහෙත් ටික ගන්න' කියලා. ඒ වගේ කථාවක් තමයි මේ තිබෙන්නේ.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස ඇයි මෙතැන දස සංඥා කියන්නේ නැතුව එහෙම අඩු කළේ?

<u>පිළිතුර</u> - මේවා විජ්ජාභාගීය ධර්ම. දස සංඥා වලදී මේ 6 ට එකතුවෙනවා 'අසුභ සංඥාව' 'ආදීනව සංඥාව' 'සබ්බලෝකේ අනභිරත සංඥාව' සහ 'අනාපාන සති සංඥාව'. මේවා විජ්ජාභාගීය ධර්ම. ගැඹුරු ධර්මයන් පිළිබඳව ඇති ඥාන විද්‍යාව ඇති කරගන්නා වූ ධර්ම කියන එකයි.

සැමදෙනාටම රත්නත්‍රයේ සරණයි! පිහිටයි! ආරක්ෂාවයි! හොඳින් ධර්මය තේරුම් අරගෙන වටහාගෙන චතුරාර්ය සත්‍යය ධර්මයන් අවබෝධ කරගෙන නිවනින් සැනසෙන්න ලැබේවා! කියලා මෛත්‍රීයෙන් ආශිර්වාද කරනවා. තෙරුවන් සරණයි!

සාධූ! සාධූ! සාධූ!



ඉහත සඳහන් ධර්ම දේශනාව

අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි